(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 412.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 නොවැම්බර් මස 08 වැනි සෙනසුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2746/'12

1\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට ක්‍රියාත්මක වන දේශීය ශල්‍ය ගෝස් කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කර්මාන්තශාලාවල සේවයේ නියුතු සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ රෝහල් සඳහා දේශීය නිෂ්පාදකයින්ගෙන් මිලදී ගනු ලබන ශල්‍ය ගෝස් ප්‍රමාණය කොපමණද;

(iv) රජයේ රෝහල්වලට දේශීය ශල්‍ය ගෝස් නිෂ්පාදන මිලදී ගැනීම කප්පාදු කිරීම නිසා බිඳ වැටෙමින් පවතින එම කර්මාන්තය රැකගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3551/'13

2\.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිටපු අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝගය විභාග වන අවස්ථාවේ "ගෝල්ඩන් කී" සහ අසාර්ථක සෙලින්කෝ පරිපාලිත සමාගම්වලට වන්දි ලබා දෙන බවට මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යවරයා කළ ප්‍රකාශය නිවැරදිද;

(ii) එසේ නම්, වන්දි ලබා දීම සිදුකළ හෝ සිදු කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(iii) ඉහත සමාගම්වල තැන්පත්කරුවන්ට නොගෙවන ලද මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම සමාගම්වල වත්කම් සහ සංචිතවලින් ගෙවීමට හැකි ප්‍රතිශතය කොපමණද;

(v) විකුණා දැමූ එක් එක් සමාගමේ නම සහ එය අලෙවි කිරීමෙන් ලැබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) ඉතිරි ගෙවීම් කිරීම සඳහා සැලසුම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "ගෝල්ඩන් කී" සමාගම සහ අසාර්ථක සෙලින්කෝ පරිපාලිත සමාගම් සහ සෙලින්කෝ සමූහ ව්‍යාපාරයේ අනෙකුත් සමාගම් යටතේ පැවති ආයතනවල නම් කවරේද;

(ii) මෙම එක් එක් සමාගම විකුණනු ලැබූ වටිනාකම කොපමණද;

(iii) තක්සේරුකරු කවුරුන්ද;

(iv) එම සමාගම් බිඳවැටෙන දිනය වන විට තිබූ අවසන් ශේෂ පත්‍ර ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4268/'13

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ සුවිශේෂී පරිසර පද්ධතියක් සහිත පදවිය වනාන්තරය රක්ෂිතයක් බවට ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කර ඇති බවත්;

(ii) එසේ කිරීමට හේතුව එහි ඇති සුවිශේෂී වැදගත්කම බවත්;

(iii) එම රක්ෂිතයෙන් ඉඩම් හෙක්ටයාර් 12900 ක කොටසක් නැවත පදිංචි කිරීමේ හා සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා ගැසට් පත්‍රයක් මගින් නැවතත් පවරා ගැනීමට කටයුතු කරමින් සිටින බවත්;

(iv) ඉහත (iii) හි සඳහන් පරිදි එම රක්ෂිතයෙන් කොටසක් අහිමිවීම ප්‍රදේශයේ කාලගුණික හා දේශගුණික වෙනස්කම් රැසක් ඇති වීම කෙරෙහි බල පෑ හැකි බවත්;

(v) එම තත්ත්වය පදවිය වැව ප්‍රධාන කොටගත් වැව් පද්ධතියේ පැවැත්ම කෙරෙහිද දැඩි ලෙස බලපෑම් එල්ල කළ හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා කඩිනමින් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4580/'13

4.

ගරු අනුර දිසානායක මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගියදා පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව වෙනුවෙන් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය හා ඊට අදාළ අනෙකුත් ආයතන විසින් දරන ලද මුළු වියදම් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් සපයා ගනු ලැබූ ආකාරය කවරේද;

(iii) එම මුදල් වැය කරන ලද ආකාරය කවරේද;

(iv) එම සමුළුවේ මාධ්‍ය ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දැරූ වියදම කොපමණද;

(v) ප්‍රචාරණ කටයුතු ලබා දුන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය කවරේද;

(vi) එම එක් එක් මාධ්‍ය ආයතනය වෙනුවෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4679/’13

5\.

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් උතුරු මැද පළාතේ වකුගඩු ප්‍රශ්නය විසඳීම සඳහා පත් කරනු ලැබූ විද්වත් කමිටුවට තෝරා ගත් අයගේ නම්, තනතුරු හා ආයතන කවරේද;

(ii) එම කමිටුව පත් කරනු ලැබූ දිනය කවරේද;

(iii) එම කමිටුව මේ වන විට රැස් වී ඇති වාර ගණන කොපමණද;

(iv) එහි අවසන් වාර්තාව භාර දෙනු ලැබූ දිනය කවරේද;

(v) එම කමිටුව විසින් එකී වාර්තාව භාර දෙනු ලැබූ අය කවුරුන්ද;

(vi) එම වාර්තාවේ කරුණු ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වාර්තාවේ නිර්දේශවල සඳහන් පරිදි කෘෂි රසායනික ද්‍රව්‍ය 4ක භාවිතය තහනම් කරනු ලැබුවේද;

(ii) එසේ තහනම් කරන ලද කෘෂි රසායනික ද්‍රව්‍ය මේ වනවිටත් වෙළඳපොළේ විකිණීමට තිබේද;

(iii) 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පළිබෝධ නාශක කවරේද;

(iv) ආනයනය කළ එම එක් එක් පළිබෝධ නාශක වර්ගයේ ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒවායේ ප්‍රමිතිය පරීක්ෂා කරනු ලැබුවේද;

(vi) එසේ නම්, පරීක්ෂා කරනු ලැබූ රසායනාගාරය හා ස්ථානය කවරේද;

(vii) ඉහත සඳහන් පරිදි ප්‍රමිති පරීක්ෂාවක් සිදු නොකළේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4775/’14

6\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති ඖෂධ අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙරට සිටින ලියාපදිංචි ඖෂධවේදීන් සංඛ්‍යාව සහ ඖෂධ බෙදාහරින්නන් සංඛ්‍යාව කොපමණද;

(iii) අප රටට අවශ්‍ය ඖෂධවේදීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) ඖෂධවේදීන් පුහුණු කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5100/’14

7\.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය පොල් නිෂ්පාදනය පහත වැටීම සඳහා මයිටා උවදුර දැඩි ලෙස බලපා තිබේද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් ඵලදාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ පහ තුළ වාර්ෂිකව අපනයනය කළ පොල් ගෙඩි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම කාල සීමාව තුළ දී පොල් ගෙඩි අපනයනයෙන් වාර්ෂිකව ලැබූ ආදායම කොපමණද;

(v) එම එක් එක් වර්ෂයේදී පැවති පොල් වගා කළ බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ තුන තුළ පොල් වගාවේ දියුණුව සහ එම වගාව මුහුණ දෙන උවදුරු සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතු සිදු කිරීමට පොල් පර්යේෂණ ආයතනය වෙත රජය සහ රාජ්‍ය නොවන ආයතන මගින් ලබා දුන් ප්‍රතිපාදන කවරේද;

(ii) පොල් වගාවේ දියුණුව සඳහා එම ආයතනය මගින් සිදු කරන ලද නව පර්යේෂණ කවරේද;

(iii) අදාළ පර්යේෂණ මගින් ලබා දී ඇති නිර්දේශයන් කවරේද;

(iv) පොල් අපනයනය ඉහළ දැමීම හා දියුණු කිරීම සඳහා එම නිර්දේශයන් ක්‍රියාත්මක කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5183/’14

8\.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැඩ අවසන්ව ඇති නොරොච්චෝල ගල් අඟුරු තාප බලාගාරයේ මෙගාවොට් 300ක ධාරිතාව සහිත පළමුවැනි අදියරේ වර්තමාන මෙහෙයුම් කටයුතු සහ නඩත්තු කටයුතු සිදු කරන සමාගම කවරේද;

(ii) එම වගකීම පවරනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත බලාගාරයේ මෙහෙයුම් කටයුතු සහ නඩත්තු කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා එහි ඉදිකිරීම් කටයුතු සිදු කළ චීන සමාගමට පැවරීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) මෙම බලාගාරයේ 2 වැනි සහ 3 වැනි අදියරයන්හි වැඩ කටයුතු නිම කිරීමට නියමිතව ඇති දින වකවානු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 3 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2015) — (දොළොස්වැනි වෙන් කළ දිනය) — කාරක සභාව. (නොවැම්බර් 7 දින ප්‍රගතිය)

*2.

තැපැල් සේවා අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 6, 10, 12, 19, 21, 25, 27, 43, 44, 59 සහ 68 වගන්ති යටතේ තැපැල් සේවා අමාත්‍යවරයා විසින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව සම්පාදනය කරන ලදුව, 2014 ජූලි 25 දිනැති අංක 1872/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.10.30 දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අධිකරණ අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 අගෝස්තු 13 දිනැති අංක 1875/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ එම පනතේ 6 වැනි වගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි

වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 02 දිනැති අංක 1882/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1]

*9.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*15.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*18.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*19.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*20.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.04.24 දින සලකා බලන ලදී.)

*21.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*22.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*23.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*26.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*27.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*28.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*29.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*30.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*31.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

32.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

35.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

36.

කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

37.

සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

38.

පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

39.

මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

40.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2015) නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---